# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1312/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 13/08/2024 පැය 1240

## මාධ්‍ය නිවේදනය

### 2024 ජනාධිපතිවරණයේ නාම යෝජනා භාරදීම 2024.08.15 වන දින මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී සිදු කිරීමට අදාලව රථවාහන සැලැස්ම.

2024.09.21 වන දින පැවැත්වීමට නියමිත 2024 වර්ෂයේ ජනාධිපතිවරණය සඳහා නාම යෝජනා භාර දීම 2024.08.15 වන දින මැතිවරණ මහලේකම් කාර්යාලයේදී සිදු කිරීමට නියමිතය.

එහිදී, 2024.08.15 වන දින උදෑසන 08.00 සිට පස්වරු 02.00 දක්වා කාලය තුල විශේෂ රථ වාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**ඒ අනුව**

- පොල්දූව දෙස සිට සහ නාවල පාරෙන් කොළඹට ඇතුළු වන සියළුම වාහන සාමාන්‍ය පරිදි වැලිකඩ හන්දිය පැමිණ එතැන් සිට ආයුර්වේද හන්දිය දක්වා ගමන් කර සාමාන්‍ය පරිදි කොළඹට ඇතුළු විය හැකිය. වැලිකඩ හන්දියත් ආයුර්වේද හන්දියත් අතර කොළඹට ඇතුළු වන පැත්තේ ඇති සියළුම අතුරු මාර්ග වලින් ශ්‍රී ජයවර්ධනපුර මාර්ගයට ඇතුළු වන සියළුම වාහන වමට හරවා බොරැල්ල ආයුර්වේද හන්දිය දෙසට ගමන් කළ යුතුය.

- බොරැල්ල කොටා පාරෙන් සහ කාසල් වීදියෙන් කොළඹින් පිටවන වාහන ආයුර්වේද හන්දියට පැමිණ ආයුර්වේද හන්දියෙන් පරණ පාර ඔස්සේ වැලිකඩ හන්දිය දක්වා ගමන් කළ හැකිය. එමෙන්ම අතුරු මාර්ග වලින් පරණ පාරට ඇතුළු වන සියළුම වාහන වමට හරවා වැලිකඩ හන්දිය දෙසට ගමන් කල යුතුය.

- 2024.08.15 වන දින උදෑසන 08.00 සිට දහවල් 02.00 දක්වා ශ්‍රී ජයවර්ධනපුර මාර්ගය ආයුර්වේද හන්දියේ සිට වැලිකඩ දක්වා (කොළඹින් පිටවීම) කොටස වාහන ගමනා ගමනය සීමා කිරීමට කටයුතු කරනු ඇත.

- 2024.08.15 වන දින උදෑසන 08.00 සිට දහවල් 02.00 දක්වා වැලිකඩ හන්දියේ සිට ආයුර්වේද හන්දිය දක්වා (කොළඹට ඇතුළු වන ) පරණ පාර කොටස වාහන ගමනා ගමනය සීමා කිරීමට කටයුතු කරනු ඇත.

- 2024.08.15 වන දින උදෑසන 08.00 සිට දහවල් 02.00 දක්වා තලවතුගොඩ හන්දියේ සිට කොළඹ දෙසට ගමන් කරන සියළුම වාහන තලවතුගොඩ හන්දිය, කිඹුලාවල හන්දිය ඔස්සේ පිටකෝට්ටේ හන්දියට පැමිණ නාවල පාර ඔස්සේ නාරාහේන්පිට දෙසට හෝ නුගේගොඩ දෙසට ගමන් කර කොළඹ දෙසට ගමන් කළ යුතුය.

- ඔබේසේකරපුර මාර්ගයෙන් පරණ පාරට පැමිණෙන වාහන මාදින්නාගොඩ හරහා වැලිකඩ හන්දියට ගමන් කළ යුතුය

- 2024.08.15 වන දින උදෑසන 08.00 සිට දහවල් 02.00 දක්වා පොල්දූව හන්දියේ සිට බොරැල්ල දෙසට සහ බොරැල්ල දෙස සිට පොල්දූව හන්දිය දක්වා කන්ටේනර් රථ ගල්, වැලි පටවන ලද ටිපර් රථ වලට ඇතුළු වීම සීමා කෙරෙනු ඇත.

- තවද ජනාධිපති අපේක්ෂකයින් සමඟ පැමිණෙන සාක්ෂිකරුවන්ගේ වාහන නැවැත්වීම සම්බන්ධයෙන් හා පාක්ෂිකයින් ස්ථාන ගත වීම සම්බන්ධයෙන් ඒ ඒ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ

- වැලිකඩ හන්දියේ සිට ශ්‍රී ජයවර්ධනපුර මාර්ගය ආයුර්වේද හන්දිය දක්වා පරණ පාර ආයුර්වේද හන්දිය සිට වැලිකඩ හන්දිය දක්වා ප්‍රදේශය මඟහැර විකල්ප මාර්ග භාවිතා කරන රියදුරන් දැනුවත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

- පහත සඳහන් මාර්ගවල බස් රථ පහත පරිදි ගමනාන්තය දක්වා ගමන් කළ යුතුය.

    - 176 මාර්ගය නාවල පාරෙන් වැලිකඩ හන්දියට පැමිණ ශ්‍රී ජයවර්ධනපුර මාර්ගය ඔස්සේ ආයුර්වේද හන්දියට පැමිණ ගමනාන්තය දක්වා ගමන් කළ යුතුය.
    - මාර්ග අංක 170, 171, 175,177,190 යන මාර්ගවල බස් රථ වැලිකඩ හන්දියට පැමිණ ශ්‍රී ජයවර්ධනපුර මාර්ගය ඔස්සේ ආයුර්වේද හන්දිය වෙත පැමිණ ගමනාන්තය දක්වා ගමන් කළ යුතුය.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය